ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2019 ඔක්තෝබර් මස 14 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2019 අගෝස්තු

### සමස්ත නිරීක්ෂණ

- ආනයන තවදුරටත් පහළ යෑම සහ පෙර මාසයට සාපේක්ෂව අපනයන අඩු වීම බොහෝදුරට යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2019 අගෝස්තු මස වෙළඳ හිඟය අඩු විය. 2019 අගෝස්තු මස ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 16.6 ක අඩුවීමක් වාර්තා කළ අතර ප්‍රධාන අපනයන කාණ්ඩවල මිල ගණන් පහළ යෑම හේතුවෙන් අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.4 කින් සුළු වශයෙන් අඩු විය.
- 2019 ජූලි මස වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 717 ක වෙළඳ හිඟයට සාපේක්ෂව 2019 අගෝස්තු මස වෙළඳ හිඟය එ.ජ. ඩොලර් මිලියන 540 ක් දක්වා අඩු විය.
- 2019 අගෝස්තු මස සංචාරක පැමිණීම් පෙර මාසයට සාපේක්ෂව සියයට 24.1 ක වර්ධනයක් වාර්තා කළ අතර පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සංචාරක පැමිණීම්හි පහළ යෑම අවම විය.
- 2019 අගෝස්තු මස විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 518 ක් දක්වා සියයට 3.0 කින් අඩු විය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු මාස අට තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,414 ක් දක්වා සියයට 7.6 කින් අඩු විය.
- 2019 අගෝස්තු මස රජය වෙත සැලකිය යුතු විදේශ ව්‍යාපෘති ණය ලැබීම් වාර්තා වූ අතර, කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් වාර්තා විය.
- 2019 අගෝස්තු මස අවසානය වනවිට දළ නිළ සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 8.5 ක් වූ අතර, එය ආනයනික මාස 5.1 කට සමාන විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව https://www.cbsl.gov.lk/si/node/6181

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2018 අගෝ එ.ජ.ඩො. මිලියන | 2019 අගෝ එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2018 ජන.- අගෝ එ.ජ.ඩො. මිලියන | 2019 ජන.- අගෝ එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,037 | 1,033 | -0.4 | 7,842 | 8,031 | 2.4 |
| ආනයන | 1,887 | 1,574 | -16.6 | 15,083 | 12,886 | -14.6 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -850 | -540 | | -7,240 | -4,854 | |
| සංචාරක ඉපැයීම් | 376 (ආ) | 270 (ඇ) | -28.3 | 2,971 (ආ) | 2,380 (ඇ) | -19.9 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 534 | 518 | -3.0 | 4,777 | 4,414 | -7.6 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -6 | -12 | | 44 | 22 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 207 | 168 | | 4,153 | 5,819 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 75 | 16 | | 657 | 432 | |
| දිගුකාලීන ණය | 132 | 152 | | 997 | 987 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 2,500 | 4,400 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | - | | 252 | 164 | |
| විදේශ සෘජු ආයෝජන (ඉ) | | | | 1,422 | 501 | |
| සමස්ත ශේෂය | | | | 474 | 1,451 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- 2019 වසරේ පළමු මාස අට තුළදී වෙළඳ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 7,240 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,854 ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 2,386 කින් අඩු විය. වෙළඳ හිඟය අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන මිල ගණන්වලට සාපේක්ෂව ආනයනවල මිල නිරූපණය කරන වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.2 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා අපනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් පහළ යෑම හේතුවිය. කෙසේ වුවද, සමුච්චිත වශයෙන් සැලකූ විට 2019 වසරේ පළමු මාස අට තුළදී වෙළඳ මිල අනුපාතය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.1 කින් සුළු වශයෙන් අඩු විය.

**රූප සටහන 1: වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2019 ජනවාරි - අගෝස්තු (එ.ජ. ඩොලර් මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2018 – 2019)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2018 – 2019)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරීත්වය

- 2019 අගෝස්තු මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,033 දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.4 කින් සුළු වශයෙන් පහත වැටුණු අතර ඒ සඳහා කෘෂිකාර්මික අපනයන ආදායම අඩුවීම හා ඉන් අනතුරුව ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම අඩුවීම හේතු වූ අතර රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම වර්ධනය විය. සියලුම ප්‍රධාන වෙළඳපොළ වෙත ඇඟලුම් අපනයන ඉහළ යෑම, විශේෂයෙන්ම යුරෝපා වෙළඳපොළ වෙත සිදුකළ අපනයන සියයට 12.9 කින් වර්ධනය වීම පිළිබිඹු කරමින් රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 7.0 කින් ඉහළ ගියේය. රසායනික නිෂ්පාදිත, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, සත්ත්ව ආහාර සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත

අපනයන ආදායම ද වර්ධනය විය. කෙසේ වුවද, ටයර් මෙන්ම ශල්‍ය හා වෙනත් අත්වැසුම් අපනයන ආදායම පහත වැටීම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණු අතර, එළවළු, පලතුරු හා ධාන්‍ය සැකසුම් මෙන්ම සකස් කළ දුම්කොළ අපනයන පහත වැටීම හේතුවෙන් ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම පහත වැටුණි. මෙම කාලපරිච්ඡේදය තුළ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ, මූලලෝහ හා උපාංග, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම ද පහත වැටුණි.

- තේ, මුහුදු ආහාර සහ එළවළු හැර කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති අනෙකුත් සියලුම උප කාණ්ඩවල අපනයන ආදායම් පහත වැටීම හේතුවෙන් 2019 අගෝස්තු මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල ගණන් පහත වැටුණ ද, අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් 2019 අගෝස්තු මාසයේදී තේ අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වුවද, කුරුඳු, කරාබුනැටි හා ගම්මිරිස් අපනයනවල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම පහත වැටුණි. මීට අමතරව, පොල්මද ආශ්‍රිත නිෂ්පාදිත මෙන්ම පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිතවල අපනයන මිල ගණන් පහත වැටීම හේතුවෙන් පොල් අපනයන ආදායම පහත වැටුණි.
- ඛනිජ ද්‍රව්‍ය අපනයන යටතේ වර්ග කර ඇති සියලුම උප කාණ්ඩවල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2018 අගෝස්තු මාසයට සාපේක්ෂව 2019 අගෝස්තු මාසයේදී ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම පහත වැටුණි.
- 2019 අගෝස්තු මාසයේ අපනයන පරිමා දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 2.9 කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 3.2 කින් පහත වැටුණි. මෙමගින් අපනයනවල දුර්වල ක්‍රියාකාරිත්වය සඳහා අපනයන මිල ගණන් පහත වැටීම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2018 අගෝ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 අගෝ. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- අගෝ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- අගෝ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **808.0** | **813.0** | **0.6** | **6,085.3** | **6,331.0** | **4.0** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 40.1 | 33.7 | (15.9) | 311.1 | 303.7 | (2.4) |
| සත්ත්ව ආහාර | 7.6 | 8.1 | 6.9 | 73.6 | 88.8 | 20.7 |
| රෙදිපිළි හා ඇඟලුම් | 467.1 | 499.6 | 7.0 | 3,451.7 | 3,736.6 | 8.3 |
| එයින් ඇඟලුම් | 436.2 | 464.4 | 6.5 | 3,222.2 | 3,478.5 | 8.0 |
| රෙදිපිළි | 22.8 | 26.5 | 16.0 | 166.0 | 187.5 | 12.9 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 8.1 | 8.8 | 8.9 | 63.5 | 70.5 | 11.1 |
| රබර් නිෂ්පාදිත | 80.5 | 72.8 | (9.6) | 584.4 | 591.2 | 1.2 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.5 | 24.3 | (0.6) | 195.3 | 199.9 | 2.4 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 37.4 | 32.5 | (13.1) | 295.7 | 275.0 | (7.0) |
| ප්‍රවාහන උපකරණ | 8.7 | 6.0 | (30.5) | 91.1 | 120.5 | 32.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 47.0 | 43.4 | (7.8) | 387.9 | 328.4 | (15.4) |
| රසායනික නිෂ්පාදිත | 16.0 | 17.0 | 6.5 | 114.7 | 120.4 | 5.0 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.0 | 10.0 | (9.7) | 92.5 | 90.9 | (1.8) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.9 | 7.4 | 52.0 | 19.3 | 31.4 | 63.0 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 11.2 | 9.7 | (13.7) | 101.9 | 74.1 | (27.3) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.5 | 6.7 | 2.5 | 50.7 | 49.2 | (2.8) |
| මූල ලෝහ හා උපාංග | 16.2 | 13.9 | (14.7) | 108.0 | 120.9 | 12.0 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 3.5 | 2.8 | (18.9) | 20.8 | 19.6 | (5.8) |
| වෙනත් | 25.8 | 25.1 | (2.8) | 186.6 | 180.3 | (3.4) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **225.4** | **217.3** | **(3.6)** | **1,723.4** | **1,667.4** | **(3.2)** |
| තේ | 116.1 | 118.7 | 2.3 | 970.2 | 915.0 | (5.7) |
| රබර් | 2.7 | 1.7 | (35.8) | 23.0 | 18.6 | (19.0) |
| පොල් | 31.1 | 28.1 | (9.7) | 209.4 | 232.1 | 10.9 |
| කුළුබඩු | 41.6 | 33.3 | (19.9) | 225.6 | 203.4 | (9.8) |
| එළවළු | 2.2 | 2.7 | 23.8 | 18.3 | 21.2 | 16.1 |
| සකස් නොකළ දුම්කොළ | 3.8 | 3.3 | (13.7) | 23.6 | 22.7 | (3.9) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 10.0 | 8.9 | (10.8) | 84.0 | 70.0 | (16.7) |
| මුහුදු ආහාර | 17.9 | 20.5 | 14.1 | 169.4 | 184.5 | 8.9 |
| **3. ඛනිජ අපනයන** | **2.8** | **1.9** | **(31.6)** | **22.2** | **21.3** | **(4.0)** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.2** | **1.2** | **5.4** | **11.5** | **11.3** | **(1.5)** |
| **මුළු අපනයන** | **1,037.4** | **1,033.3** | **(0.4)** | **7,842.4** | **8,031.1** | **2.4** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම පිළිබිඹු කරමින් 2019 අගෝස්තු මාසයේදී ආනයන වියදම අඛණ්ඩව දහවෙනි මාසයටත් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,574 ක් දක්වා සියයට 16.6 කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණි .
- ආහාර හා පාන වර්ග සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙඅංශයේම ආනයන පහත වැටීම පිළිබිඹු කරමින් 2019 අගෝස්තු මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. කුළුබඩු, කිරි නිෂ්පාදිත, එළවළු සහ මුහුදු ආහාර ආනයන පහත වැටීම ආහාර හා පාන වර්ග ආනයන පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අතර පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයනය පහත වැටීම ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහත වැටීම සඳහා හේතු විය. සහනදායී පදනම මත රථවාහන ආනයන සඳහා වූ බලපත්‍ර භාවිතා කරමින් රථවාහන ආනයනය කිරීම සිදුකිරීම ඇරඹීමෙන්  2019 ජූලි මාසයේ දී පෞද්ගලික රථවාහන ආනයනය පෙර මාසවලට සාපේක්ෂව ඉහළ යෑමක් දක්නට ලැබුණ ද 2018 දෙසැම්බර් මාසයේ සිට දක්නට ලැබූ ආනයන පහළ යෑමේ  ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් මෙම මාසයේදී ද පෞද්ගලික රථවාහන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 46.2 කින් පහත වැටුණි. කෙසේ වුවද, 2019 අගෝස්තු මාසයේදී සීනි හා රසකැවිලි, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය.
- ප්‍රධාන වශයෙන් ආනයන පරිමා හා මිල ගණන් පහත වැටීමෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන වියදම පහත වැටීම හේතුවෙන් 2019 අගෝස්තු මාසයේදී  අන්තර් භාණ්ඩ ආනයන වියදම ද පහත වැටුණි. රෙදිපිළි හා රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදිත, කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, ඉදිරි මහ කන්නය ඉලක්ක කරගනිමින් විශාල වශයෙන් පොහොර ආනයනය කිරීම හේතුවෙන් 2019 අගෝස්තු මාසයේදී පොහොර ආනයන වියදම පසුගිය වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව දෙගුණයකට වඩා වැඩි අගයකින් ඉහළ ගිය අතර, මූල ලෝහ සහ තිරිඟු හා ඉරිඟු ආනයනය ද  ඉහළ ගියේය.
- යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය පහළ යෑම හේතුවෙන් 2019 අගෝස්තු මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් දුම්රිය ආශ්‍රිත උපකරණ ආනයනය ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.
- 2018 අගෝස්තු මාසයට සාපේක්ෂව ආනයන පහත වැටීම සඳහා ආනයන පරිමාව මෙන්ම ආනයන මිල ගණන් පහළ යෑම ද හේතු වූ බව පිළිබිඹු කරමින් ආනයන පරිමා දර්ශකය සියයට 9.3 කින් සහ ආනයන මිල දර්ශකය සියයට 8.0 කින්  පහත වැටුණි.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලය: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2018 අගෝ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 අගෝ. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- අගෝ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- අගෝ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **431.2** | **332.1** | **(23.0)** | **3,441.3** | **2,499.2** | **(27.4)** |
| ආහාර හා පාන වර්ග | 128.6 | 117.9 | (8.3) | 1,148.1 | 917.1 | (20.1) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.7 | 2.9 | 71.6 | 113.2 | 22.2 | (80.4) |
| කිරි නිෂ්පාදිත | 40.9 | 38.0 | (7.1) | 231.2 | 216.1 | (6.5) |
| එළවළු | 25.3 | 22.5 | (11.1) | 220.4 | 187.6 | (14.9) |
| මුහුදු ආහාර | 19.3 | 18.0 | (6.5) | 136.0 | 145.8 | 7.2 |
| සීනි හා රසකැවිලි | 8.9 | 13.0 | 46.9 | 180.8 | 126.4 | (30.1) |
| කුළුබඩු | 11.0 | 6.7 | (39.4) | 73.1 | 68.1 | (6.9) |
| පාන වර්ග | 7.3 | 5.9 | (19.7) | 57.5 | 52.1 | (9.4) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 14.2 | 11.0 | (23.0) | 136.0 | 98.9 | (27.2) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 302.6 | 214.2 | (29.2) | 2,293.2 | 1,582.0 | (31.0) |
| පෞද්ගලික රථවාහන | 142.7 | 76.7 | (46.2) | 1,092.4 | 496.4 | (54.6) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 49.5 | 50.9 | 2.8 | 349.2 | 350.5 | 0.4 |
| රෙදිපිළි හා උපාංග | 25.1 | 18.4 | (26.7) | 214.6 | 174.5 | (18.7) |
| ගෘහ උපකරණ | 20.6 | 17.6 | (14.6) | 158.7 | 131.3 | (17.3) |
| විදුලි සංදේශ මෙවලම් | 24.6 | 16.0 | (35.0) | 184.7 | 157.2 | (14.9) |
| ගෘහ හා දැව භාණ්ඩ | 14.9 | 14.0 | (5.7) | 112.1 | 104.7 | (6.6) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 25.1 | 20.4 | (18.7) | 181.4 | 167.6 | (7.6) |
| **2. අන්තර් භාණ්ඩ** | **1,061.6** | **863.8** | **(18.6)** | **8,356.8** | **7,379.8** | **(11.7)** |
| ඉන්ධන | 398.6 | 261.2 | (34.5) | 2,768.8 | 2,576.8 | (6.9) |
| එයින් බොරතෙල් | 108.9 | 45.3 | (58.4) | 595.3 | 630.8 | 6.0 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 289.6 | 215.8 | (25.5) | 2,026.2 | 1,820.7 | (10.1) |
| ගල් අඟුරු | 0.1 | 0.1 | (48.1) | 147.3 | 125.3 | (14.9) |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 9.9 | 8.9 | (9.8) | 518.4 | 118.4 | (77.2) |
| එයින් රත්‍රන් | 0.1 | … | (98.2) | 438.0 | 1.7 | (99.6) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 247.8 | 233.5 | (5.8) | 1,857.9 | 1,876.9 | 1.0 |
| රසායනික නිෂ්පාදිත | 77.4 | 66.8 | (13.6) | 601.9 | 553.5 | (8.0) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 59.9 | 50.0 | (16.6) | 471.7 | 394.9 | (16.3) |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 47.9 | 42.0 | (12.4) | 345.7 | 295.5 | (14.5) |
| මූල ලෝහ | 34.6 | 41.5 | 19.9 | 415.6 | 366.2 | (11.9) |
| පොහොර | 14.5 | 32.2 | 121.3 | 153.3 | 137.5 | (10.3) |
| තිරිඟු හා ඉරිඟු | 23.9 | 24.9 | 4.2 | 235.9 | 203.4 | (13.8) |
| ආහාර සැකසුම් | 27.5 | 18.2 | (33.9) | 207.9 | 154.9 | (25.5) |
| කෘෂිකාර්මික යෙදවුම් | 19.3 | 13.3 | (31.0) | 136.1 | 127.1 | (6.6) |
| ඛනිජ නිෂ්පාදිත | 31.6 | 11.3 | (64.2) | 129.7 | 137.0 | 5.7 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 68.6 | 60.1 | (12.4) | 513.8 | 437.7 | (14.8) |
| **3. ආයෝජන භාණ්ඩ** | **393.5** | **376.3** | **(4.4)** | **3,212.2** | **3,001.8** | **(6.6)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 222.7 | 184.4 | (17.2) | 1,703.0 | 1,610.2 | (5.4) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 134.2 | 132.6 | (1.2) | 1,013.0 | 1,006.9 | (0.6) |
| ප්‍රවාහන උපකරණ | 36.0 | 58.9 | 63.3 | 492.0 | 380.2 | (22.7) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.5 | 0.4 | (27.1) | 4.3 | 4.5 | 6.1 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.8** | **1.4** | **75.0** | **72.3** | **4.8** | **(93.3)** |
| **මුළු ආනයන** | **1,887.1** | **1,573.6** | **(16.6)** | **15,082.7** | **12,885.5** | **(14.6)** |

… සැලකිය යුතු නොවේ

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව සංචාරක පැමිණීම්හි දක්නට වූ පහළ යෑම බොහෝ සෙයින් යථා තත්ත්වයට පත්වෙමින් පවතී. ඒ අනුව, 2019 ජූලි මස වාර්තා වූ 115,701 ට සාපේක්ෂව 2019 අගෝස්තු මස සංචාරක පැමිණීම් සංඛ්‍යාව 143,587 ක් දක්වා සියයට 24.1 කින් ඉහළ ගියේය. මේ අතර, පෙර වසරේ අනුරූප මාසවලට සාපේක්ෂව, 2019 වසරේ ජූලි මාසයේ වූ සියයට 46.9 ක අඩුවීම සහ ජූනි මාසයේදී වූ සියයට 57.0 ක අඩු වීමට සාපේක්ෂව 2019 අගෝස්තු මාසයේ සංචාරක පැමිණීම්හි පහත වැටීම සියයට 28.3 ක අවම අගයක් වාර්තා විය. මෙම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව චීනය, එක්සත් රාජධානිය, ප්‍රංශය සහ ජර්මනිය වැනි ප්‍රධාන රටවල්වලින් පැමිණි සංචාරකයින් ගණන අඩු වීමයි.
- 2018 අගෝස්තු මාසයේදී වාර්තා වූ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 376 ට සාපේක්ෂව 2019 අගෝස්තු මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 270 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සමුච්චිත පදනම මත, සංචාරක ඉපැයීම් 2018 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,971 ට සාපේක්ෂව මෙම වසරේ අනුරූප කාලය තුළදී එ.ජ. ඩොලර් මිලියන 2,380 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
- මේ අතර, 2019 අගෝස්තු මාසයේදී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 518 ක් දක්වා සියයට 3.0 කින් අඩු විය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු මාස අට සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,414 ක් දක්වා සියයට 7.6 කින් පහත වැටුණි.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර (අගෝස්තු)**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2019 වසරේ අගෝස්තු මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 156 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, වසරේ පළමු මාස අට තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 285 ක් විය.
- ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන, 2019 වසරේ අගෝස්තු මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 12 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එසේ වුවද, 2019 වසරේ පළමු මාස අට තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 22 ක ශුද්ධ ලැබීමක් වාර්තා විය.
- තවද, 2019 අගෝස්තු මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 83 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. 2019 අගෝස්තු මාසයේදී රජය වෙත සමාජ සංවර්ධන හා යටිතල පහසුකම් ව්‍යාපෘති ගණනාවක් සඳහා සැලකිය යුතු ව්‍යාපෘති ණය ලැබීම් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

- 2019 වසරේ අගෝස්තු මස අවසානය වනවිට දළ නිළ සංචිත එ.ජ. ඩොලර් බිලියන 8.5 ක් වූ අතර, එය ආනයනික මාස 5.1 කට සමාන විය. මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2019 අගෝස්තු මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 11.3 ක් වූ අතර, එය ආනයනික මාස 6.8 කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 වසරේ ඔක්තෝබර් මස 14 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 1.1 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, ජපන් යෙන් සහ කැනේඩියානු ඩොලරය හැර අනෙකුත් සියලු ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ද අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 (ඔක්. 14 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +1.1% |
| යුරෝ | -12.7% | +4.9% |
| ස්ටර්ලින් පවුම | -11.4% | +1.9% |
| ජපන් යෙන් | -18.1% | -0.8% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | -2.0% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +5.2% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව